Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකය: ..........................................................................................................

### I - කොටස

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

❖ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

1. පහත වැව් අතරින් පණ්ඩුකාභය රජු විසින් ඉදිකරවන ලද්දේ,
   1. යෝධ වැව ය. 2. කලා වැව ය. 3. තිසා වැව ය. 4. ජය වැව ය.

2. තේක්කම් අමුණ ඉදිකර ඇත්තේ කුමන ඔයක් හරස් කරමින් ද?
   1. මල්වතු ඔය 2. දැදුරු ඔය 3. කිරිඳි ඔය 4. කලා ඔය

3. පොළොන්නරු යුගයේ දී ඉදිකරන ලද ගොඩනැගිල්ලකි
   1. ඇම්බැක්කේ දේවාලය 2. අභයගිරිය 3. දෙමළ මහා සෑය 4. ගඩලාදෙණිය

4. රජරට ශිෂ්ටාචාර සමයට අයත් කලාත්මක ම බෝධිඝරය වනුයේ,
   1. මැදිරිගිරිය බෝධිඝරය යි. 2. නිල්ලක්කගම බෝධිඝරය යි.
   3. සීගිරිය බෝධිඝරය යි. 4. ථූපාරාම බෝධිඝරය යි.

5. උඩරට සිංහල රාජවංසයේ අවසාන පාලකයා කවුරුන් ද?
   1. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු 2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
   3. දෙවන විමලධර්මසූරිය රජු 4. ශ්‍රී විජය රාජසිංහ රජු

❖ අංක 6 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් වරහන තුළ (✓) ලකුණ ද වැරදි නම් වරහන තුළ (×) ලකුණ ද යොදන්න

6. පොළොන්නරු අවධියේ දී හින්දු බලපෑම මත සඳකඩපහණින් ඇත් රූපය ඉවත් විය. ( )
7. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා දළදා පෙරහර ට දේවාල පෙරහර ද එක් කොට එය වඩා උත්කර්ෂවත් කළේ ය. ( )
8. බ්‍රිතාන්‍ය අත්අඩංගුවට පත් වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසීන් විසින් ලංඩන් නගරයට රැගෙන යන ලදි. ( )
9. බොලොඤ්ඤා යනු ඉතාලියේ පිහිටි විශ්ව විද්‍යාලය කි. ( )
10. ඩොනෙටෙලෝ ද පුනරුද සමයේ සිටි ප්‍රතිමා ශිල්පියෙ කි. ( )

❖ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

11. ආළිසාර හෙවත් ඇළහැර ඇළ .................................... රජුගේ වාරි නිර්මාණය කි.
12. ලක්දිව පුරාතන වාරිමාර්ග නම් කෘතිය .................................... මහතා විසින් රචනා කර ඇත
13. දාගැබක සෞන්දර්යාත්මක අගය වැඩි දියුණු කිරීම සඳහා දාගැබ් ආශ්‍රිතව සතර දිශාවට මුහුණ ලා .................................... සතරක් ද ඉදි කර ඇත.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

14. උඩරට ප්‍රභූවරයෙකු වූ .................................... සීතාවක රාජසිංහ රජුට උඩරට රාජ්‍යය අත්පත් කර ගැනීමට ආධාර කළේ ය.

15. මහනුවර යුගයේ දී පොළවට ගල් කණු සිටුවා එම ගල් කණුවලට ලී කණු පුරුද්දා හෝ බාල්ක යොදා .................................... විහාර ඉදි කෙරුණි

(මහසෙන් , වීරසුන්දර බණ්ඩාර , වසභ , ටැම්පිට , ලෙන් , සෙනරත් පරණවිතාන, වටදාගෙය , ආයක , බ්‍රෝහියර් කොනප්පු බණ්ඩාර )

❖ අංක 16 සිට 20 දක්වා I තීරුවේ සඳහන් තොරතුරු හා II තීරුවේ සඳහන් තොරතුරු ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

16.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. වසභ | A. හුරුළු වැව |
| 2. මහසෙන් | B. මිණිපේ ඇළ |
| 3. ධාතුසේන | C. මහවිලච්චිය |
| 4. පළමු අග්බෝ | D. පාදුලකවාපී |

(i) ABCD (ii) CBDA (iii) CADB (iv) DCBA

17.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අනුරාධපුරය | A. දෙගල්දොරුව |
| 2. මිහින්තලේ | B. කණ්ඨක චෛත්‍ය |
| 3. පොළොන්නරුව | C. ජේතවනාරාමය |
| 4. මහනුවර | D. කිරිවෙහෙර |

(i) ABCD (ii) CBDA (iii) CADB (iv) DCBA

18.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ථූපාරාමය | A. නිශ්ශංකමල්ල |
| 2. මිරිසවැටිය | B. දේවානම්පියතිස්ස |
| 3. අභයගිරිය | C. දුටුගැමුණු |
| 4. රන්කොත්වෙහෙර | D. වළගම්බා |

(i) ACBD (ii) BCDA (iii) CDAB (iv) DBCA

19.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. හිඳි පිළිමය | A. දඹේගොඩ |
| 2. හිටි පිළිමය | B. අවුකන |
| 3. සැතපෙන පිළිමය | C. ගල්විහාරය |
| 4. බෝසත් පිළිමය | D. තොළුවිල |

(i) ACBD (ii) BCDA (iii) CDAB (iv) DBCA

20.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ඩාන්ටේ | A. ඉතාලිය |
| 2. විලියම් ශේක්ෂ්පියර් | B. ජර්මනිය |
| 3. ඉරාස්මස් | C. එංගලන්තය |
| 4. මාටින් ලූතර් | D. ප්‍රංශය |

(i) ACDB (ii) BADC (iii) CDAB (iv) DBAC

මුළු ලකුණු (2 × 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවීම සඳහා වෙන ම කඩදාසි භාවිතා කරන්න.

---

(01) (A) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන පොකුණ පිහිටි උයන නම් කරන්න.

(ii) එම උයන පිහිටි පැරණි නගරය කුමක් ද?

(iii) එම උයන කාගේ පරිහරණය සඳහා ඉදිකරන ලද්දක් ද?

(iv) මෙම පොකුණු සඳහා ජලය ලබාගත් වැව කුමක් ද?

(ලකුණු 04)



(B) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන ගොඩනැගිලි වර්ගය හඳුන්වන නම කුමක් ද?

(ii) ඡායාරූපයෙන් දැක්වෙන ගොඩනැගිල්ල දැක ගත හැකි ප්‍රදේශය කුමක් ද?

(iii) මෙවැනි ඉදිකිරීම් සිදුකරන්නේ කුමන ගොඩනැගිල්ලක ආරක්ෂාව සඳහා ද?

(iv) මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇත්තේ කුමන රාජධානි සමයක දී ද?

(ලකුණු 04)



(C) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන රජතුමා කවුරුන් ද?

(ii) ඔහු කුමන රාජධානියක පාලකයෙක් ද?

(iii) මෙතුමා විසින් ලංකාවෙන් පළවා හරින ලද විදේශික ජන කණ්ඩායම කවුරුන් ද?

(iv) මෙතුමාගෙන් පසුව ලංකාවේ පාලකයා බවට පත් එතුමාගේ පුතා කවුරුන් ද?

(ලකුණු 04)



(D) මෙහි දැක්වෙන ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න


(i) මෙම සිතියමේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකරන ලද විශාල වැවකි එය හඳුනාගෙන නම් කරන්න

(ii) ශ්‍රී ලංකාවේ අවසන් රාජධානිය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

(iii) ඇළහැර අමුණ ඉදිකර ඇති ගංගාව ඉංග්‍රීසි B අක්ෂරයෙන් දැක්වේ එම ගංගාව කුමක් ද?

(iv) හයවන පැරකුම් රජුගේ පාළන මධ්‍යස්ථානය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

(ලකුණු 04)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(02) (i) මහසෙන් රජතුමා විසින් ඉදිකරන ලද වැව් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) විශාල වැව් තැනවීම නිසා ලාංකිකයන් ලබා ගත් ජයග්‍රහණ **දෙකක්** නම් කරන්න (ලකුණු 04)

(iii) වාරි තාක්ෂණය සම්බන්ධයෙන් ඔබ උගත් කරුණු ඇසුරෙන් පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

| වැවක අංග | ඉටුවූ කාර්යය |
|---|---|
| A.................................... | වැවේ සියලු ජලය නිම්නයට මුදාහැරීම |
| මඩසොරොව්ව | B........................................................... |
| C.................................... | වැවේ ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම |
| රළපනාව | D........................................................... |

(ලකුණු 04)

(03) (i) ශ්‍රී ලංකාවේ පැවති පහත කර්මාන්තවල නිරත වූ පිරිස් හැඳින් වූ ආකාරය නම්කරන්න (ලකුණු 03)

A. ලෝහ වැඩ ................................

B. තඹ වැඩ ................................


C. බෙලෙක් වැඩ ................................

(ii) ගන්ධ කුටි සම්ප්‍රදායට අනුව ලංකාවේ ඉදිකර ඇති පැරණි පිළිම ගෙවල් **හතරක්** නම් කරන්න (ලකුණු 04)

(iii) පහත ඡායාරූප නම්කරන්න.


A.........................


B ..............



C ..........................


D .....................

(ලකුණු 04)

(04) (i) මහනුවර රාජධානියට අභියෝග එල්ල කළ යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) මහනුවර රාජධානිය පාඩමෙන් ඔබ උගත් තොරතුරු ඇසුරෙන් පහත සටහන සම්පූර්ණ කරන්න (ලකුණු 04)




(iii) පහත කාර්යන් සිදුකරන ලද පුද්ගලයන් නම්කරන්න

A. සීතාවක රාජසිංහ රජුගේ ආක්‍රමනයත් සමඟ පෘතුගීසීන් වෙත පළා ගිය කරළියද්දේ රජුගේ දියණිය ............................................

B. දෙල්ගමුව විහාරයේ වැඩසිටි දළදා වහන්සේ මහනුවරට වැඩම කරවීම ......................................

C. වර්ෂ 1617 දී පෘතුගීසීන් සමඟ සාම ගිවිසුමක් ඇති කර ගැනීම ................................................

D. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසීන් අල්ලා ගන්නා අවධියේ උඩරට .................... (ලකුණු 04)

(05) (i) මහනුවර රාජධානි සමයේ ආර්ථික කටයුතුවල පැවති ප්‍රධාන අංශ **තුන** නම් කරන්න (ලකුණු 03)

(ii) මහනුවර රාජධානි සමයේ ලංකාවට ආනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය **හතරක්** නම් කරන්න (ලකුණු 04)

(iii) මහනුවර චිත්‍ර කලාවේ දැකිය හැකි කැපීපෙණෙන ලක්ෂණ **හතරක්** නම් කරන්න (ලකුණු 04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(06) (i) ඉතාලියේ පිහිටි දියුණු නගර **තුනක්** නම් කරන්න (ලකුණු 03)

(ii) පුනරුදය සමයට පෙර අවධියේ කලා ශිල්පවල දැකියහැකි ලක්ෂණ **හතරක්** නම් කරන්න (ලකුණු 04)

(iii) පුනරුදය පාඩමේ දී ඔබ උගත් කරුණු ඇසුරින් පහත වගුවේ හිස්තැන් පුරවන්න (ලකුණු 04)

| පුද්ගලයා | සොයාගැනීම |
|---|---|
| 1 A ........................... | පෘථිවිය හා අනෙකුත් ග්‍රහ වස්තූන් සූර්යයා වටා ගමන් කරන බව |
| 2 B........................... | සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සියල්ල වෘත්තාකාරව නොව ඉලිප්සාකාරව සූර්යයා වටා ගමන් කරන බව මෙ |
| 3 විලියම් හාවේ | C ....................................................... ....................................................... |
| 4 ජොහැන්නස් ගුටෙන්බර්ග් | D ....................................................... |

(07) ඡායාරූප ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න



**A**



**B**

1) වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමූ රජතුමා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
.......................................................

2) B ඡායාරූපයෙන් දැක්වෙන රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කරන ලද විහාරයක් නම් කරන්න
.......................................................


3) A ඡායාරූපයෙන් දැක්වෙන රජතුමා කවුද?
.......................................................

4) ඔහු විසින් පෘතුගීසීන් පරාජයට පත්කරන ලද සටනක් නම් කරන්න
.......................................................

5) මේ දෙදෙනා අතරින් ජෝන් ෆයිබස් නම් ඉංග්‍රීසි දූතයෙකු මුණගැසුන රජතුමාගේ නම කුමක් ද?
.......................................................



**C**



**D**

6) C ඡායාරූපයෙන් දැක්වෙන නිර්මාණය හඳුනාගෙන නම් කරන්න
.......................................................

7) එය නිපද වූ පුද්ගලයා හැඳින්වීමට භාවිත කළ අන්වර්ත නාමය කුමක් ද?
.......................................................

8) D ඡායාරූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?
.......................................................



**E**



**F**

9) ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයන් දෙදෙනා අතරින් පියේටා ප්‍රතිමාව නිර්මාණය කළ ශිල්පියා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
.......................................................

10) එය නිපද වූ පුද්ගලයා හැඳින්වීමට භාවිත කළ අන්වර්ත නාමය කුමක් ද?
.......................................................

11) මොවුන් දෙදෙනා අතරින් අන්තිම රාත්‍රී භෝජනය නම් සිතුවම අඳින ලද පුද්ගලයා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? ..................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com